ඉන්දියානු මහ **කොමසාරිස්** කාර්යාලය
**කොළඹ**

පුවත්පත් නිව**ේදනය**

<u>ඉන්දීය වෙරළාරක්ෂක බලකායේ නෞ**කා** දෙකක් ක**ොළඹ** සහ ගාල්ලේ සංචාරයක</u>

ඉන්දීය වෙරළාරක්ෂක බලකායට අයත් වෛභව් සහ අභිරාජ් යන ගැඹුරු මුහුද නිරීක්ෂණ සහ වේගවත් නිරීක්ෂණ නෞකා ද්විත්වය2024 දෙසැම්බර් 23-27 දක්වා කොළඹ ද 2024 දෙසැම්බර් 29 සිට 2025 ජනවාරි 02 දක්වා ගාල්ලේ ද සංචාරයක නිරත වීමට නියමිතය. ඉන්දීය වෙරළාරක්ෂක නෞකා ද්විත්වයේ අණදෙන නිලධාරිවරුන් වන කමාන්ඩන්ට් නවතේජ් සිං සොහාල් මහතා සහ කමාන්ඩන්ට් (JG) එස්. සුජිත් මහතා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ අධ්‍යක්ෂ ජනෙරාල්තුමා සහ අනෙකුත් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් හමු වනු ඇත. VBSS, ගිනි නිවීම් සහ හානි පාලනය සහ සමුද්‍ර දූෂණ ප්‍රතිචාර පිළිබඳ ඒකාබද්ධ පුහුණු මෙන්ම විවිධ වෘත්තීය අන්තර් ක්‍රියාකාරකම් රැසක් ද මෙම සංචාරයන් අතරතුරදී සිදු කිරීමට නියමිතය.

2. ආරක්ෂක අංශයේ සහ සිවිල් පරිපාලනයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු ශ්‍රී ලංකාවේ විවිධ අමුත්තන් සඳහා ප්‍රිය සම්භාෂණයක් ද නෞකාවන්හිදී පැවැත්වෙනු ඇත. ශාරීරික, මානසික සහ ආධ්‍යාත්මික සුබසිද්ධිය ළඟා කරගැනීම සඳහා යෝගා වැඩසටහනක් ද පැවැත්වීමට කටයුතු යොදු ඇත. "පුනිත් සාගර් අභියන්" යටතේ සමුද්‍රීය ප්ලාස්ටික් දූෂණය පිටුදැකීම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා වෙරළ පිරිසිදු කිරීමේ වැඩසටහන් සහ ඇවිදීමේ වැඩසටහන් ආදි විවිධ සමාජීය අන්තර්ක්‍රියාවන් ද නෞකාවන් විසින් පවත්වනු ඇත.

3. ජනතාව අතර සබඳතා මෙන්ම ඉන්දීය වෙරළාරක්ෂක බලකාය සහ එහි හැකියාවන් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ සාමාජිකයන්ට නෞකාවන් නැරඹීමේ අවස්ථාව ද හිමි වනු ඇත.

4. මෙම නෞකා සංචාරයන් කලාපයේ පොදු සමුද්‍රීය ආරක්ෂාව සඳහා පවතින අභියෝගයන්ට ඵලදායිව මුහුණදීම සඳහා ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ හැකියාවන් ඉහළ නැංවීම සඳහා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සහයෝගීතාවය වර්ධනය කරගැනීමෙහිලා ද වැදගත් වේ.

5. ඉන්දීය නාවික හමුදා සබ්මැරීනයක් වන වේලා සබ්මැරීනය 2024 නොවැම්බර් 10-13 දක්වා කොළඹ සංචාරයක නිරත විය. ඉන්දීය නාවික හමුදාවේ සහ වෙරළාරක්ෂක බලකායේ නෞකාවන් විසින් ශ්‍රී ලංකාවේ සිදුකරන සංචාර අසල්වැසි රාජ්‍යයන් දෙකෙහි මිත්‍රශීලි නාවික හමුදාවන් අතර සහෝදරත්වය සහ කාර්ය සහයෝගීතාවය ශක්තිමත් කිරීම අරමුණු කරයි. එය ඉන්දියාවේ සාගර් හවෙන් කලාපයේ සැමට ආරක්ෂාව සහ වර්ධනය යන දැක්ම සහ 'අසල්වැසියා ප්‍රථමයනේ' යන ප්‍රතිපත්තිය සමඟ ද සමපාත වේ.

***

**කොළඹ**